# අම්පාර රජගල පැරණි ආරාම සංකීර්ණයෙන් හෙළිවන භූමි කළමනාකරණ විධිවිධාන පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ජේ.එම්.ඩී.එන්. ජයසිංහ[1] , එම්.කේ.එල්. අයිරාංගනී මලවරගේ[2]

ප්‍රමුඛ පදඃ රජගල, භූමිය, ආරාම සංකීර්ණය, කළමනාකරණය, පරිසරය

## හැඳින්වීම

මෙරට කඳු පාදක බෞද්ධ ආරාම සංකීර්ණ බොහෝවිට ආගමික හා සංස්කෘතික වැදගත්කමක් ඇති ස්ථාන පමණක් නොව, පැවිදි ජීවිතයට සහ තිරසාර පැවැත්මට සහාය වන ආදර්ශමත් ඉඩම් කළමනාකරණ පද්ධති ද මූර්තිමත් කරයි. 'ශාක, සත්ත්ව, ජල සම්පත, භූමිය යනාදී වූ පාරිසරික සම්පත් හානිය අවම වන පරිදි පරිභෝජනය කිරීම හා එම සම්පත් අනාගත පරපුරට ආරක්ෂා කරදීමට කටයුතු කිරීම' පරිසර සම්පත් කළමනාකරණය යනුවෙන් සරලව අර්ථ දැක්විය හැකි ය. පරිසරයෙන් තොරව මිනිසාට පැවැත්මක් නොමැති බව මැනවින් දකිමින් පරිසරයෙහි සුරක්ෂිතතාව පිණිසත්, පරිසරය හා බද්ධව ගැටලුවකින් තොරව මිනිසාට ජීවත්වීම පිණිසත් වැදගත් වන ජීවන දර්ශනයක් බුදුන් වහන්සේ අනුදැන වදාළහ. ක්‍රි.පූ. තුන්වැනි සියවසේ සිදු වූ මහින්දාගමනයත් සමඟ මෙරට තුළ පරිසර කළමනාකරණය පිළිබඳව වැඩි අවධානයක් යොමු වන්නට පටන් ගත් අතර බුදු දහම ස්ථාපිත වීමත් සමඟ වර්ධිත විවිධ විහාරාරාම අතරින් හුදෙකලා ශේෂ කඳු කේන්ද්‍ර කරගනිමින් මෙරට තුළ ඉදි වූ ලෙන් ආරාම තුළින් ඉහත කී පරිසර කළමනාකරණය මැනවින් විද්‍යාමාන වේ. රජගල යනු මිහින්තලේ, රිටිගල, අරන්කැලේ, කුඩුම්බිගල ආදී වනගත භික්ෂු වාසස්ථාන මෙන් අනුරාධපුර යුගයේ දී ප්‍රසිද්ධියක් ලැබූ භික්ෂු ආරාමයකි. මහින්දාගමනය තහවුරු කෙරෙන ප්‍රධාන පුරාවිද්‍යාත්මක සාධක වශයෙන් මිහිඳු හිමියන්ගේ සහ ඉට්ඨිය තෙරුන්ගේ භස්මාවශේෂ තැන්පත් කරන ලද ස්තූපයක් හා ඒ සම්බන්ධ ශිලා ලේඛනයක් හමුවීම තුළින් මෙම භූමියට විශාල ඓතිහාසික වැදගත්කමක් ද හිමිව තිබේ. මෙම ආරාම සංකීර්ණය තුළ දැකගත හැකි පරිසර කළමනාකරණ උපාය උපක්‍රම විවිධ පාරිසරික සංරචක ඇසුරින් හඳුනාගත හැකි ය. මෙහි ආරාමික සැලසුම සහ අවකාශීය සංවිධානය, ජල සංරක්ෂණය, වන කළමනාකරණය සහ භෞමික පාලනය පිළිබඳ මූලධර්ම පිළිබිඹු කරමින් භූමි කළමනාකරණ විධිවිධාන ගොඩනගා තිබූ ආකාරය කෙබඳුදැයි අනාවරණ කරගැනීම පර්යේෂණයේ ගැටළුවයි. මූලික වශයෙන්ම අනුරාධපුර අවධියේ ඉදි වූ වෙනත් ආරාමවල භූමි කළමනාකරණ ක්‍රමවේදයන් සමඟ සසඳමින් රජගල ආරාම සංකීර්ණයේ භූමිය කළමනාකරණය සිදුකොට ඇති ආකාරය හඳුනා ගැනීම, එකී ආදර්ශයන් වත්මන් පරිසර ගැටලුවලට විසඳුම් ලෙස යොදා ගත හැකි ආකාරය හා එහි ඵලදායීතාව පිළිබඳව සලකා බැලීම මූලික අරමුණු වේ.

[1,2] මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
nimanthijayasinghe2000@gmail.com iranganirjt@gmail.com

**ක්‍රමවේදය**

මෙහි අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජගලතැන්න ග්‍රාම නිලධාරී වසමට අයත් රජගල කන්ද ආශ්‍රිත පැරණි ආරාමික පරිශ්‍රය අධ්‍යයනයට ලක් කෙරිණි. දත්ත එක්රැස් කිරීමේදී ක්ෂේත්‍ර ගවේෂණය සහ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනය සිදුකරන ලදී. ඓතිහාසික සංසන්දනාත්මක ක්‍රමවේදය හා තේමා විශ්ලේෂණ ක්‍රමවේදය යටතේ දත්ත විශ්ලේෂණය කරන ලදී.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

මෙරට තුළ බුදු දහම ස්ථාපනය වීමෙන් අනතුරුව ඉදි වූ අනුරාධපුර මහා විහාරය වැනි ප්‍රධාන විහාරාරාම මෙන්ම අග නගරයෙන් දුරබැහැර පිහිටි ආරාම සංකීර්ණයන් ද බෞද්ධ චින්තනයට අනුගතව පාරිසරික සම්පත් මනාව කළමනාකරණය කරමින් ඉදිකර ඇත. රජගල ලෙන් ආරාමය ඉදිකිරීමට හුදෙකලා කඳුවැටියක් තෝරාගැනීම ම පරිසර කළමනාකරණ ක්‍රමවේදයකි. මන්ද යත් අධ්‍යාත්මික සංවර්ධනය කෙරෙහි යොමුවන භික්ෂූන්ගේ වාසස්ථානය වීම නිසාම එකී කලාපය ගෞරවනීයත්වයට පත් වී මානව ක්‍රියාකාරකම්වලින් තොර රක්ෂිතයක් බවට නිරායාසයෙන් පත්වන බැවිණි. අනුරාධපුරය කේන්ද්‍ර කරගෙන ඉදි වූ මහා විහාර සංකීර්ණයන් හා සැසඳීමේ දී ඒ බොහෝමයක් පවතින භූමිය වෙනස් කරමින් විශාල අවකාශයක් තුළ ව්‍යාප්ත වන ආකාරයට ඉදිකළ ඒවා වුවත් රජගල ආරාමය එය පිහිටි කඳුකර භූ දර්ශනයට අනුගතව, භූමිය පුළුල් වෙනසකට ලක් නොකරමින් ආරාමයේ අංගෝපාංගයන් ඉදි කිරීමට උත්සහ දරා ඇති ආකාරය පෙනී යයි.

මෙහි ඉදිකිරීම් කලාප ලෙස හඳුනාගත හැකි ලෙන් සංකීර්ණය සහිත කලාපය, පොදු ගොඩනැගිලි සහිත කලාපය, ආගමික ගොඩනැගිලි සහිත කලාපය හා සුසාන සහිත කලාපය ආදී වශයෙන් සියල්ලක්ම ගොඩනැගීම සඳහා ආවේණික භූමියේ සුවිශේෂිතා හා පාරිසරික පිහිටීම උපයෝගී කරගෙන ඇත. ඒ අනුව මෙහිදී හමුවන පළමු ආගමික ගොඩනැගිලි කලාපය වන ස්තූප ද්විත්වය එකිනෙකට වෙනස් භූමි දර්ශනයන් දෙකක නිර්මාණය කර ඇති අතර ඒ අනුව විශාල ස්තූපය උස් වූ භූමි කලාපයකත් කුඩා ස්තූපය ඊට වඩා පහත් භූමි කලාපයකත් ඉදිකර ඇත. මෙවැනි ප්‍රමාණයෙන් කුඩා ස්තූප සිතුල්පව්ව, මිහින්තලය ආදී කඳු ආශ්‍රිත ව ඉදි වූ විහාරවලත් දක්නට ලැබේ.

එමෙන් ම කඳු මුදුනේ දක්නට ලැබෙන කුඩා වැව ඉදිකිරීමේ දී කඳු පර්වතය මධ්‍යයේ වුවත් එහි සීමිත තැනි නිම්න ස්වරූපය කේන්ද්‍ර කරගෙන වැව ඉදිකර ඇති අතර ස්වාභාවිකත්වය ඉක්මවා නොයන ආකාරයට වැවේ ජලය පිටතට යෑම වැළැක්වීම සඳහා ගල් බැම් බැඳීම සිදු කර ඇත. තවත් කාරණයක් වන්නේ පවත්නා වියළි දේශගුණික තත්ත්වය මත කෘත්‍රිම ආකාරයට ජල සම්පාදනයක් සිදු කිරීම වෙනුවට භූමියට බලපෑමක් නොකර උල්පත් ජලය හා වැසි ජලය මනාව කළමනාකරණය කිරීමයි. ඊට නිදසුනක් ලෙස මතුපිට භූමියට විශාල

බලපෑමක් සිදු නොවන පරිදි භූගත ජල මාර්ග ඇසුරෙන් උල්පත් ජලය ප්‍රයෝජනයට ගෙන ඇත. වැසි ජලය ගබඩා කරගැනීමේදීත් භූමිය මත හැරීමක් සිදු නොකොට ස්වභාවිකව නිර්මාණය වූ ගල් කෙම් ජලය ගබඩා කිරීමට යොදාගෙන ඇත.

**සමාලෝචනය**

මෙහි බොහෝ ගොඩනැගිලි ශිලාමය මාධ්‍යන්ගෙන් ඉදිකිරීම (ගලින්ම කළ ශෛලමය කුටි, ගල් පීලි), ශීතලෙන් ඇතුළු ලෙන්වල ගෙබිම, ජනෙල්, වා කවුළු, පියස්ස ආදිය නිර්මාණය කිරීමේදී ස්වභාවික පරිසරයට හානියක් නොවන පරිදි අමුද්‍රව්‍ය භාවිත කිරීම, ඉදිකිරීම් කලාප අතර සබඳතාව ඇති කිරීම සඳහා ස්වභාවික භූමි දර්ශනයට අනුව පඩිපෙළවල් සකස් කර තිබීම ද ආදී ක්‍රමෝපායන් ද භූමි කළමනාකරණ උපායමාර්ගයන් ලෙස පෙන්වා දිය හැකි ය. සමස්තයක් ලෙස මෙම කඳුකර ආරාම සංකීර්ණය භික්ෂු වාසස්ථානයක් ලෙස යොදා ගැනීමේ දී මෙකී කඳුකර භූ දර්ශනය මනාව හසුරුවමින් ස්වාභාවිකත්වය ඉක්මවා නොයන ආකාරයට භූමිය කළමනාකරණය කර ඇති බව නිගමනය කළ හැකි ය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

අමිල, දඹර. හෙට්ටිආරච්චි, කරුණාසේන. කපුකොටුව, ඇලෙක්සැන්ඩර්. මණ්ඩාවල, පී.බී. (2015). ***ඓතිහාසික රජගල,*** රජගල පුරාවිද්‍යා ව්‍යාපෘතිය.

ගුණවර්ධන, පී. (2010). ***ශ්‍රී ලංකාවේ පැරණි බෞද්ධ සංඝාරාම***. සමන්ති ප්‍රකාශකයෝ, ජා ඇළ.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඒකාබද්ධ රජගල පුරාවිද්‍යා ව්‍යාපෘතිය, (2018). ***රජගල පුරාවිද්‍යා පර්යේෂණ.*** ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.